දිවි තොර කරගැනීම් යනු සමාජ සෞඛ්‍ය ගැටළුවක් බැවින්, ඒ පිළිබඳව සමාජය දැනුවත් කිරීමට කටයුතු කිරීම අවශ්‍ය වේ. එහිදී එවැනි සිදුවීම් සම්බන්ධයෙන් පුවත් වාර්තාවන් ඉදිරිපත් කිරීමේ ගැටළුවක් නැත. නමුත්, දිවි තොර කරගැනීම් පිළිබඳ පුවත් වාර්තාවන් ඉදිරිපත් කිරීමේදී අතිශයින්ම ප්‍රවේසම්කාරී විය යුත්තේ, ඒ ඔස්සේ තවත් අනුකාරක දිවි තොරකරගැනීම් ඇති නොවන ලෙසින් එම පුවත් වාර්තාවන් ඉදිරිපත් කිරීමටයි. ඒ සඳහා විශේෂයෙන් හඳුන්වා දී ඇති මාධ්‍ය ආචාර ධර්ම නිර්දේශයන්ද තිබේ.

උදාහරණ ලෙසින් දක්වන්නේ නම්, දිවි තොර කරගැනීමක් සම්බන්ධයෙන් පුවත්පතක මුල් පිටුවක හෝ ඇතුළු පිටුවක ඉහළ කොටසේ සඳහන් කිරීම ඔස්සේ එම පුවතට ප්‍රමුඛතාවයක් ලබාදීම නොකළ යුත්තක් ලෙසින් සැලකේ. මන්දයත්, දිවි තොර කරගැනීමකට ලැබෙන එම අනවශ්‍ය අවධානයද අනුකාරක දිවි තොර කරගැනීමකට උත්ප්‍රේරකයක් විය හැකි බැවිනි.

පුවත් වාර්තාවක දිවි තොර කරගත් ආකාරය සඳහන් කිරීම ඔස්සේ, දිවි තොර කරගැනීමට නැඹුරුතාවක් ඇති අයෙකු එම ක්‍රමය අනුගමනය කිරීමේ අවදානමක් ජනිත කරයි.

එසේම හදිසි උපකාරක අංක සඳහන් කිරීම ඔස්සේ, දිවි තොර කරගැනීමේ නැඹුරුතාවක් ඇති අයෙකුගේ ජීවිතය ගලවා ගැනීමට අවකාශයක් ලැබෙනු ඇත.

දිවි තොර කරගැනීම් වාර්තාකරණයේදී මෙම මාධ්‍ය ආචාර ධර්ම පිළිපැදීම ඔස්සේ, එය සමාජ සෞඛ්‍ය ගැටළුවක් ලෙසින් ඉදිරිපත් කරන අතරම, අනුකාරක දිවි තොර කරගැනීම් ඇතිවීම වැළැක්වීමටද ඉඩ හසර ලැබෙනු ඇත. එය මාධ්‍ය වගකීමක්ද ලෙසින් ගත හැක.

හදිසි උපකාරක අංක:

*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860

*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

**#MediaEthicsSL #lka #sinhalanews #Lankadeepa**